10586

OL/2025(2026)/87/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**87 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | |
|---|---|
| **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II** | *පැය තුනයි* |
| தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II | *மூன்று மணித்தியாலம்* |
| Communication and Media Studies I, II | *Three hours* |

| | |
|---|---|
| අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes | **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.** |

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ප්‍රාග් ඓතිහාසික යුගයේ මුල් කාලීන සන්නිවේදන ක්‍රමයක් වූයේ,
(1) ගුහා චිත්‍රයි. (2) කථන භාෂාවයි. (3) රූපාක්ෂරයි. (4) හෝඩියයි.

**2.** ප්‍රදීපාගාර උපක්‍රමය භාවිත කරනුයේ කුමන සන්නිවේදන වර්ගයේ දී ද?
(1) ජන සන්නිවේදනයේ දී ය. (2) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ය.
(3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ දී ය. (4) සමූහ සන්නිවේදනයේ දී ය.

**3.** ශ්‍රී ලංකාව තුළ ගුවන්විදුලි සේවාවක් ආරම්භ කිරීමෙහිලා පුරෝගාමියා ලෙස සලකනු ලබන්නේ කවරෙක් ද?
(1) ජෝන් එන්. ලැම්ප්සන් (2) ශ්‍රීමත් හියු ක්ලිෆර්ඩ්
(3) එඩ්වඩ් හාර්පර් (4) විලියම් හෙන්රි මැනිං

**4.** කිසියම් තොරතුරක් නිශ්චිත පුද්ගලයකු වෙත සෘජුව ලබා දීමට සුදුසුම මුද්‍රිත මාධ්‍යය කුමක් ද?
(1) පුවත්පත (2) සඟරාව (3) පෝස්ටරය (4) අත්පත්‍රිකාව

**5.** පංචේන්ද්‍රිය මගින් විවිධ සංදේශ ග්‍රහණය කර ගෙන ඒවා තේරුම් ගැනීම හඳුන්වන්නේ,
(1) සමාජානුයෝජනය ලෙස ය. (2) සංජානනය ලෙස ය.
(3) අර්ථ බාධකය ලෙස ය. (4) රසඥතාව ලෙස ය.

**6.** මාධ්‍ය සන්දේශයක යටිපෙළ කියවා ගැනීම සඳහා ග්‍රාහකයාට උපකාරී වන්නේ,
(1) විචාරකයා ය. (2) සංස්කාරකවරයා ය.
(3) දොරටු පාලකයා ය. (4) විස්තර කථකයා ය.

**7.** පුවත්පත් මාධ්‍යය තුළ හාස්‍යය හා උපහාසය සමග එක් වූ තොරතුරු වාර්තා කිරීම සඳහා වඩාත් යෝග්‍ය ආකාරය වන්නේ කුමක් ද?
(1) ප්‍රවෘත්තිය (2) සංස්කාරක වැකිය
(3) කාටූනය (4) විශේෂාංග ලිපිය

**8.** ප්‍රජා ගුවන්විදුලි සේවාවක් වන්නේ කුමක් ද?
(1) මහනුවර (2) රුහුණු (3) රජරට (4) මහවැලි

**9.** කාර්යාලයක දෛනික කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමේ දී අවම දායකත්වයක් ලබා දෙන්නේ,
(1) ගණක යන්ත්‍රයයි. (2) නිල මුද්‍රා යන්ත්‍රයයි.
(3) මුදල් සටහන් යන්ත්‍රයයි. (4) තැපැල් මුද්‍රා යන්ත්‍රයයි.

[දෙවැනි පිටුව බලන්න.

10. ශ්‍රී ලංකාවේ මුල් කාලීන විද්‍යුත් මාධ්‍ය පවත්වාගෙන යාමේ පදනම වූයේ,
(1) තරඟකාරිත්වයයි. (2) වාණිජ පරමාර්ථයි.
(3) තෝරා ගත් ග්‍රාහක පිරිසයි. (4) විනෝදාස්වාදය සහ අධ්‍යාපනයයි.

11. ප්‍රවෘත්ති වටිනාකම්වලට අදාළ **නොවන්නේ**,
(1) කාලීන බව ය. (2) සමීප බව ය. (3) සාමාන්‍ය බව ය. (4) අදාළ බව ය.

12. පහත මෙවලම් අතරින් විද්‍යුත් උපකරණයක් ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) පිටු පෙරළනයයි. (2) පත්‍රිකා ලෑල්ලයි.
(3) අන්තර් ක්‍රියාකාරී පුවරුවයි. (4) කාන්දම් ලෑල්ලයි.

13. අප පරිහරණය කරන මාධ්‍ය අතරින් පරිකල්පනයේ දියුණුවට වැඩි අනුබලයක් ලබා දෙන්නේ,
(1) පුවත්පත හා ගුවන්විදුලියයි. (2) ගුවන්විදුලිය හා සිනමාවයි.
(3) සිනමාව හා රූපවාහිනියයි. (4) රූපවාහිනිය හා ගුවන්විදුලියයි.

14. පෙරහැරේ ගිනිබෝල කරකවන වේගය වැඩිවන විට එය තනි ගිනි වළල්ලක් ලෙස දර්ශනය විය. එයට හේතු වූ විද්‍යාත්මක සංකල්පය වන්නේ,
(1) දෘෂ්ටියේ අඛණ්ඩතාවයි. (2) සංජානනයයි.
(3) මාධ්‍ය බාධකයයි. (4) පරිකල්පනයයි.

15. අන්තර්ජාලයේ ජනප්‍රිය සෙවුම් යන්ත්‍රයක් වන්නේ,
(1) වට්ස්ඇප් ය. (WhatsApp) (2) ගුගල් ය. (Google)
(3) ලින්ක්ඩ්ඉන් ය. (LinkedIn) (4) ෆේස්බුක් ය. (Facebook)

16. පහත ලක්ෂණ සලකන්න.
- භාෂාව විධිමත් ය.
- ඇතැම් අවස්ථා සඳහා සම්මත ආකෘති පවතී.
- සම්මත ව්‍යාකරණ විධි භාවිත කෙරේ.

ඉහත ලක්ෂණ ඇතුළත් සන්නිවේදන ස්වරූපය කුමක් ද?
(1) ලිඛිත සන්නිවේදනය (2) වාචික සන්නිවේදනය
(3) ශ්‍රව්‍ය සන්නිවේදනය (4) දෘශ්‍ය සන්නිවේදනය

17. පෞද්ගලික පුවත්පත් ආයතන හිමිකරුවකු **නොවන්නේ** කවුරුන් ද?
(1) ඩී.ආර්. විජේවර්ධන (2) අනිල් විජේවර්ධන
(3) උපාලි විජේවර්ධන (4) රංජිත් විජේවර්ධන

18. ප්‍රවෘත්ති පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එය යටිකුරු පිරමීඩ ආකෘතිය භාවිත කරයි.
(2) එය නිර්මාණාත්මක රචනයකි.
(3) එය ආරම්භයේ දී හැඳින්වීමක් ඇතුළත් කරයි.
(4) එය නිගමනයකින් අවසන් කරයි.

19. යුනෙස්කෝ සන්නිවේදන විශේෂඥ පෝල් ද මැසෙනියර් විසින් ඉදිරිපත් කරන ලද්දේ,
(1) දෘෂ්ටියේ අඛණ්ඩතාව පිළිබඳ සිද්ධාන්තයයි.
(2) ප්‍රවෘත්තියක විශ්වසනීයත්වය පිළිබඳ සමීකරණයයි.
(3) සන්නිවේදනය පිළිබඳ ගණිතමය සූත්‍රයයි.
(4) පුද්ගල සංඛ්‍යාව පදනම් කරගත් සන්නිවේදන වර්ගීකරණයයි.

20. මෙම රූපයෙන් දැක්වෙන ලෝක පූජිත සිනමාකරු වන්නේ,
(1) තෝමස් අල්වා එඩිසන් ය.
(2) ගුග්ලිඑල්මෝ මාර්කෝනි ය.
(3) ජෝන් ලෝගී බෙයාර්ඩ් ය.
(4) චාලි චැප්ලින් ය.



[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


**21.** සජීවී රූපවාහිනී වැඩසටහනකට ප්‍රතිචාර දැක්වීමට වඩාත් සුදුසු සහ වේගවත්ම ක්‍රමවේදය වන්නේ,
(1) දුරකථන ඇමතුමයි. (2) විද්‍යුත් තැපැලයි.
(3) තැපැල්පතයි. (4) ලිපියයි.

**22.** ශ්‍රී ලංකාවේ දැනට මුද්‍රණය නවතා දමා ඇති පුවත්පත් වර්ගය කුමක් ද?
(1) ළමා පුවත්පත් (2) අධ්‍යාපනික පුවත්පත්
(3) චිත්‍රකතා පුවත්පත් (4) කාන්තා පුවත්පත්

**23.** ජෝන් ලොක්, ජෝන් මිල්ටන්, ජෝර්ජ් ස්ටුවර්ට් මිල් සහ තෝමස් ජෙෆර්සන් අයත් වන්නේ පහත දැක්වෙන කුමන කාණ්ඩයට ද?
(1) ජනමාධ්‍යකරුවන් (2) සාහිත්‍යකරුවන් (3) සිනමාකරුවන් (4) ප්‍රතිසංස්කරණවාදීන්

**24.** සමාජ මාධ්‍ය පිළිබඳ සිසුන්ගේ අදහස් කිහිපයක් පහත දැක්වේ.
ශශික : සමාජ මාධ්‍යවල තොරතුරු වේගයෙන් පැතිරෙනවා.
රිෂී : හොඳ තොරතුරු තියෙනවා. ඒත් ව්‍යාජ තොරතුරු බහුලයි.
නදී : ඔව්. වගකීමෙන් භාවිත කළේ නැත්නම් තමන්ටයි සමාජයටයි දෙකටම හානි වෙනවා.
සමාජ මාධ්‍ය පිළිබඳව නිවැරදි අදහස් දක්වන්නේ,
(1) ශශික හා නදී පමණි. (2) රිෂී හා ශශික පමණි.
(3) නදී හා රිෂී පමණි. (4) ශශික, රිෂී හා නදී යන තිදෙනාම ය.

**25.** පහත රූප සටහන සලකන්න.



ඉහත රූපසටහනින් දැක්වෙන්නේ,
(1) තනි දාමයයි. (2) සම්භාවිතා දාමයයි.
(3) පර්ෂද දාමයයි. (4) ඕපාදූප දාමයයි.

**26.** ග්‍රාහකයා පොළඹවා ගැනීමට මාධ්‍ය යොදා ගන්නා උපායමාර්ග තේරුම් ගැනීමට ඇති හැකියාව සෘජුව අදාළ වන්නේ,
(1) දැන්වීම්කරණයටයි. (2) ජනමාධ්‍ය විචාරයටයි.
(3) අත්දැකීම් පසුතලයටයි. (4) විචාරශීලී ග්‍රාහකත්වයටයි.

**27.** චිත්‍රපටයක දර්ශනතලවල දී ලබා ගන්නා ඡායාරූප ප්‍රමුඛව භාවිත වන්නේ,
(1) නළු නිළියන් පිළිබඳ සිහිවටන ලෙස තබා ගැනීමටයි.
(2) රූපගත කිරීම්වල අඛණ්ඩතාව පවත්වා ගැනීමටයි.
(3) චිත්‍රපටයේ පෝස්ටරය නිර්මාණය කිරීමටයි.
(4) විශේෂ අවස්ථා මාධ්‍යය වෙත මුදාහැරීමටයි.

**28.** වර්තමානයේ විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වල නිවේදකයන් සමග නිවේදිකාවන් ද නිරන්තරයෙන් දක්නට ලැබෙයි. මෙම අවස්ථාව හා වඩාත් සමීප සංකල්පය වන්නේ,
(1) ප්‍රජාතන්ත්‍රවාදයයි. (2) මානව ධර්මතාවයි.
(3) ස්ත්‍රී පුරුෂ සමාජභාවයයි. (4) පුරවැසිභාවයයි.

**29.** අන්තර්ජාලය ඔස්සේ ශ්‍රවණය කළ හැකි ගුවන්විදුලි සේවා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සංකීර්ණ ක්‍රියාවලියකින් යුක්ත වේ.
(2) සාපේක්ෂ අඩු වියදම් විධි ක්‍රමයකි.
(3) කෙටි තරංග පමණක් භාවිත කරයි.
(4) විද්‍යුත් චුම්භක තරංග කාර්යක්ෂමව භාවිත කරයි.

30. "නිසි මොහොතකට පෙර හෝ පසු ග්‍රහණය කර ගන්නා ඡායාරූප සාර්ථක නොවේ." මෙම කියමන වඩාත් අදාළ වන්නේ,
   (1) උපන් දිනයක කේක් කපන මොහොතක් ඡායාරූපයකට ගන්නා අවස්ථාවකට ය.
   (2) පුවත්පත් විශේෂාංගයකට ඡායාරූපයක් ගැනීමේ අවස්ථාවකට ය.
   (3) ධාවන තරගයක අවසාන මොහොත ඡායාරූපයට ගැනීමේ අවස්ථාවකට ය.
   (4) අධ්‍යාපන චාරිකාවක සමූහ ඡායාරූපය ගැනීමේ අවස්ථාවකට ය.

31. පුවත්පතක ඡායාරූපයක් පළ කිරීමේ දී ආචාරධර්ම පදනම ආරක්ෂා වන අවස්ථාව කුමක් ද?
   (1) කෘත්‍රිම බුද්ධිය (AI) තාක්ෂණය ඇසුරෙන් ඡායාරූප සකස් කර එය පුවත්පතකට ලබා දීමයි.
   (2) අන්තර්ජාලයෙන් ලබාගත් ඡායාරූප පුවත්පතට ලබා දීමයි.
   (3) අනතුරකට ලක් වූ පුද්ගලයින්ගේ ඡායාරූප අනන්‍යතාව හෙළිවන අකාරයෙන් වාර්තා කිරීමයි.
   (4) වෙනත් ඡායාරූප ශිල්පියකුගේ නිර්මාණ ඔහුගේ අවසරය සහිතව භාවිත කිරීමයි.

32. මාධ්‍යක් මගින් යමෙකුට සිදුවූ හානියක් පිළිබඳ කටයුතු කිරීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති ආයතනය වන්නේ,
   (1) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමයි.
   (2) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමයි.
   (3) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලයයි.
   (4) ශ්‍රී ලංකා කර්තෘ සංසදයයි.

33. ඩී. එම්. කොළඹගේ පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) ශ්‍රී ලාංකීය රූපවාහිනිය ආරම්භ කිරීමෙහි ලා මූලික විය.
   (2) ශ්‍රී ලාංකීය ගුවන්විදුලිය ආරම්භ කිරීමෙහි ලා පුරෝගාමී විය.
   (3) මෙරට ප්‍රථම ගුවන්විදුලි නිවේදකයා ය.
   (4) මෙරට පුවත්පත් කලාවෙහි කෘතහස්ථ මාධ්‍යවේදියෙකි.

34. ඡායාරූපයක් ගැනීමේ දී අනිවාර්යයෙන් සම්බන්ධවන මූලික අංග මොනවා ද?
   (1) නිරූපණ ශිල්පියා / ඡායාරූප ශිල්පියා / කැමරාව / ආලෝකය
   (2) ඡායාරූප ශිල්පියා / කැමරාව / අපේක්ෂිත දර්ශනය / කෘත්‍රිම බුද්ධිය
   (3) ජංගම දුරකථනය / ඡායාරූප ශිල්පියා / ආලෝකය / නිරූපණ ශිල්පියා
   (4) ඡායාරූප ශිල්පියා / කැමරාව / අපේක්ෂිත දර්ශනය / ආලෝකය

35. මාධ්‍ය ආයතනයක ප්‍රාදේශීය මාධ්‍යවේදියා
   (1) මාධ්‍ය ආයතනයේ උසස්වීම් සහ වරප්‍රසාදවලට හිමිකම් කියයි.
   (2) මාධ්‍ය ආයතනය වෙත පූර්ණ කාලීනව සේවා සපයයි.
   (3) සපයන සේවාවට අදාළව පමණක් ගෙවීම් ලබා ගනියි.
   (4) විශ්‍රාම යාමත් සමග මාධ්‍ය කටයුතු අවසන් කරයි.

36. පහත ප්‍රකාශ සලකන්න.
   - ඉදිරියෙන් තිරයක් තිබිය යුතු ය.
   - දුරස්ථ පාලකයක් මගින් ක්‍රියාත්මක කළ හැකි ය.
   - වීඩියෝ දර්ශන නැරඹිය හැකි ය.

   ඉහත ප්‍රකාශ අදාළ වන්නේ,
   (1) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය.
   (2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය.
   (3) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය.
   (4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ය.

37. ෂැනොන් වීවර් ගණිතමය සන්නිවේදන සූත්‍රයේ දී 'ඝෝෂා' යන්නෙන් අදහස් කරන්නේ,
   (1) සන්දේශය සංඥා බවට පත් කර සම්ප්‍රේෂණය කිරීමයි.
   (2) සංඥා නැවත සන්දේශ බවට පත් කර ග්‍රාහකයා ප්‍රතිග්‍රහණය කර ගැනීමයි.
   (3) ග්‍රාහකයාට නිසි පරිදි සන්දේශ ග්‍රහණය කරගැනීමට නොහැකි වීමයි.
   (4) සංඥා හා සංකේතවලින් පමණක් සන්දේශය සමන්විත වීමයි.

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**38.** මාධ්‍ය විචාරකයාගේ ප්‍රමුඛ භූමිකාව වන්නේ,
(1) සංදේශවලට අවශ්‍ය මූලාශ්‍ර සපයා දීමයි.
(2) මාධ්‍ය හා ග්‍රාහකයා අතර සම්බන්ධතාව ගොඩනැගීමයි.
(3) මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ ග්‍රාහකයා දැනුවත් කිරීමයි.
(4) සංදේශවල සැබෑ ස්වභාවය ග්‍රාහකයාට හඳුන්වා දීමයි.

**39.** පුවත්පත් හිමිකාරීත්වයේ ස්වභාවය හා ඊට අදාළ පුවත්පත් පහත දැක්වේ.

| | හිමිකාරීත්වය | | පුවත්පත් |
|---|---|---|---|
| 1 | කර්තෘ හිමි | A | ඩේලි නිව්ස් |
| 2 | මහජන සංවිධාන හිමි | B | කවට කතිකයා |
| 3 | පෞද්ගලික ව්‍යාපාර හිමි | C | ඥානාර්ථ ප්‍රදීපය |
| 4 | රජයට හිමි | D | වීරකේසරී |

ඉහත හිමිකාරීත්වයට අදාළ පුවත්පත නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
(1) 1 A, 2 B, 3 C, 4 D
(2) 1 A, 2 C, 3 D, 4 B
(3) 1 B, 2 D, 3 C, 4 A
(4) 1 B, 2 C, 3 D, 4 A

**40.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ප්‍රකාශය කුමක් ද?
(1) සැම පුරවැසියෙකුටම භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට හිමිකමක් ඇත.
(2) තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සැම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.
(3) අනුන්ගේ බාධාවක් නොමැති ව තම මත දැරීමටත් දේශ සීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් අයිතියක් ඇත.
(4) ප්‍රජාවගේ සංස්කෘතියට සහභාගී වීමට, කලාව රසවිඳීමට හා ඒවායේ ප්‍රතිලාභ බෙදා හදා ගැනීමට සැම කෙනෙකුටම අයිතියක් ඇත.

* *

PAST PAPERS WIKI

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** දඩයම් යුගයේ සිටි ප්‍රාථමික මානවයා ක්‍රම ක්‍රමයෙන් විශ්ව මිනිසකු බවට පරිවර්තනය වීමේ දී සන්නිවේදනය ප්‍රබල සාධකයක් විය.

(i) සාම්ප්‍රදායික දෘශ්‍ය සන්නිවේදන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂතා **දෙකක්** ලියන්න.

(iii) භාෂාවේ මූලික කාර්ය **දෙකක්** සඳහන් කරන්න.

(iv) සාම්ප්‍රදායික සමාජයේ ජීවත් වූ මිනිසා භාවිත කළ ශබ්ද මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

(v) පුවත්පත් පළ කෙරෙන වාරය අනුව වර්ග කරනු ලබන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(vi) ගුවන්විදුලි මාධ්‍යයේ දුබලතා **දෙකක්** දක්වන්න.

(vii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රාජ්‍ය රූපවාහිනී ආයතන **දෙක** නම් කරන්න.

(viii) නව මාධ්‍ය ස්වභාවයට අදාළ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ix) පරිගණකය භාවිතයේ දී ඔබ අනුගමනය කරන ආචාරධර්ම **දෙකක්** සඳහන් කරන්න.

(x) තොරතුරු හුවමාරු කරගැනීමේ දී ඔබ භාවිතයට ගන්නා සමාජ මාධ්‍ය ජාල **දෙකක්** නම් කරන්න.

**2.** (i) පුවත්පත් මාධ්‍යය තුළ ග්‍රාහකයා හඳුන්වන නාමය කුමක් ද?

(ii) නිෂ්ක්‍රීය ග්‍රාහකයා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(iii) පුවත්පත් අන්තර්ගතය පිළිබඳ පහත සඳහන් ආකෘති විස්තර කරන්න.

(අ) ප්‍රවෘත්ති

(ආ) විශේෂාංග ලිපි

(ඉ) වෙළෙඳ දැන්වීම්

(iv) ජන සන්නිවේදනයේ ස්වභාවය ප්‍රධාන කරුණු **හතරක්** යටතේ පැහැදිලි කරන්න.

**3.** ස්වාභාවික ව්‍යසන අවස්ථාවක දී ප්‍රවාහන, විදුලිබලය හා දුරකථන සේවා අඩාල වීමෙන් තොරතුරු දැනගැනීමට නොහැකිව ඇතැම් ග්‍රාමීය ප්‍රදේශ හුදෙකලා බවට පත් විය හැකි ය.

(i) ව්‍යසන අවස්ථාවක දී ඉක්මනින් තොරතුරු දැන ගත හැකි ප්‍රධාන ජනමාධ්‍යය කුමක් ද?

(ii) තොරතුරු දැනගැනීමේ සමාජීය අවශ්‍යතාවට අදාළ කරුණු **දෙකක්** ලියන්න.

(iii) ජනමාධ්‍ය මගින් සමාජය වෙත සිදු කරනු ලබන බලපෑම් **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) තොරතුරු රැස්කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** විස්තර කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**4.** "මාධ්‍ය සමාජයට මග පෙන්වයි" යන්න මෙවර පාසල් මාධ්‍ය උළෙලේ තේමා පාඨයයි.

(i) වර්තමානයේ විකාශය වන රූපවාහිනී ටෙලිනාට්‍ය බොහෝමයක කතා තේමාව ගොනු වී ඇත්තේ කුමන සමාජ සංස්ථාව වටා ද?

(ii) බුද්ධිමය දේපළ පනතේ 'කෘතිය' ලෙස හඳුන්වන නිර්මාණ වර්ග **දෙකක්** නම් කරන්න.

(iii) විද්‍යුත් පුවත්පතක ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ජනසන්නිවේදනයේ පහත කාර්ය **දෙක** සාකච්ඡා කරන්න.

(අ) පෙළඹවීම

(ආ) විනෝදාස්වාදය

**5.** දකුණු ආසියානු ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලිය ඉන්දියාවේ දී අවසන් වූයේ ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීන් අමන්දානන්දයට පත් කරමිනි. ජනමාධ්‍ය සහ නව මාධ්‍ය ඔස්සේ සජීව ලෙස එහි සුවිශේෂ අවස්ථා දැකගැනීමට අපට හැකි විය.

(i) රූපවාහිනී මාධ්‍ය අයත් වන්නේ කුමන සන්නිවේදන වර්ගයකට ද?

(ii) මාධ්‍ය අභිසාරිතාවෙහි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

(iii) ඉහත සිද්ධියට අදාළව රූපවාහිනී මාධ්‍යයේ පහත ලක්ෂණවල වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

(අ) ශ්‍රව්‍ය - දෘශ්‍ය බව

(ආ) සමීප බව

(ඉ) සජීව බව

(iv) ඉහත තරගාවලිය රූපවාහිනිය ඔස්සේ වාර්තා කිරීමේ දී පහත වැඩසටහන් ප්‍රභේද දෙක යොදා ගත හැකි ආකාරය වෙන වෙනම විස්තර කරන්න.

(අ) ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන්

(ආ) වාර්තා වැඩසටහන්

**6.** සාෂා විසින් මාෂාට කියන ලද තොරතුරක් පසුව ලැව්ගින්නක් සේ පැතිර ගියේ ය.

(i) ඉහත ආකාරයෙන් තොරතුර පැතිර යාමට අදාළ අවිධිමත් සන්නිවේදන ආකෘතිය කුමක් ද?

(ii) එකිනෙකා අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ දී භාවිත කළ හැකි මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.

(iii) අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ගුවන්විදුලි ආයතනයක පහත අංශවල කාර්යභාරය විස්තර කරන්න.

(අ) වැඩසටහන් අංශය

(ආ) දැන්වීම් අංශය

**7.** සන්නිවේදනයේ දී නිර්මාණශීලී වීම මෙන්ම ආචාරධර්මානුකූල වීම ද වර්තමානයේ දී වැදගත් වේ.

(i) වෘත්තීය ඡායාරූප ශිල්පියකු සතු විය යුතු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ii) සන්නිවේදන කාර්යයට අවශ්‍ය මූලාශ්‍ර **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) සන්නිවේදනයේ දී යොදා ගන්නා නිර්මාණාත්මක ප්‍රකාශන විධි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.


(iv) "නිර්මාණකරුවන්ගේ සුරක්ෂිතභාවය හා බුද්ධිමය දේපළ පනත" මැයෙන් වචන **100-150** අතර රචනාවක් ලියන්න.

* * *


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200




Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE